821

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන - 5 වන මට්ටම

2022/2023 අවසාන පරීක්ෂණය

**EPU5550 - ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාව**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2024.02.18 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පමණක් පිළිතුරු සපයන්න.**

## 01 - වන කොටස

01. ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී ගුරුවරයා අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ දැනුම භාවිත කරන්නේ කෙසේ ද? කරුණු තුනක් (03) ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

02. තෝන්ඩයික් විසින් ඉදිරිපත් කරන ලද ඉගෙනීම පිළිබඳ තැන් වරද න්‍යායෙහි මූලධර්ම දෙක (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

03. සිසුන් ගේ හැසිරීම පිළිබඳ දෙමව්පියන්ගෙන් දත්ත (තොරතුරු) ලබා ගැනීම සඳහා යොදා ගත හැකි විවෘත ප්‍රශ්න දෙකක් (02) ලියන්න. එම දත්තම ලබා ගැනීමට හැකිවන සේ එම ප්‍රශ්න සංවෘත ප්‍රශ්න ලෙස ලියන්න.

04. සූදානම යන සංකල්පය උදාහරණයක් මඟින් පැහැදිලි කරන්න.

05. පූර්ව ක්‍රියාකාරී චින්තන අවධියේ (අවුරුදු 2 – 7) දරුවන් තුළින් ප්‍රදර්ශනය වන ප්‍රජානන සංවර්ධනය ආශ්‍රිත චර්යා ලක්ෂණ හතරක් (04) ලියන්න.

06. අවශ්‍යතා පිළිබඳ ඉතා ක්‍රමානුකූල මෙන් ම සම්පූර්ණ විග්‍රහයක් මාස්ලෝගේ අවශ්‍යතා පිළිබඳ න්‍යාය (1954) ඉදිරිපත් කරයි. එම අවශ්‍යතා අනුපිළිවෙළ සඳහන් කරන්න.

07. දරුවන් තුළින් ප්‍රදර්ශනය වන චිත්තවේග ස්වරූප පහක් (05) ලියන්න.

08. ප්‍රජානන සංවර්ධනය පිළිබඳ බෲනර්ගේ න්‍යායෙන් හෙළිදරව් කෙරෙන ප්‍රධාන සිද්ධාන්ත දෙක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට භාවිත කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 02 - කොටස

09. (i.) උදාහරණ දක්වමින් අධ්‍යාපන මනෝ විද්‍යාවේ භාවිත වන පර්යේෂණාත්මක ක්‍රම සහ පර්යේෂණාත්මක නොවන ක්‍රම නිර්වචනය කරන්න. (ලකුණු - 05)

(ii.) ළමුන්ගේ හැසිරීම් අධ්‍යයනය සඳහා භාවිත කිරීමට සුදුසු පර්යේෂණාත්මක නොවන ක්‍රම දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු - 09)

(iii.) ඔබ ඉහත සාකච්ඡා කරන ලද ක්‍රම දෙකේ ප්‍රබලතා තුනක් (03) සහ දුබලතා තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු - 06)

10. (i.) ආරම්ය සාධක හා පරිසරාත්මක සාධක ළමයෙකුගේ වැඩීම හා සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය උදාහරණ ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු - 10)

(ii.) නිවෙස් පරිසරය ළමයෙකුගේ වැඩීම හා සංවර්ධනයට යෝග්‍ය වන අයුරින් සකස් කර ගැනීමට ගුරුවරයෙකු ලෙස ඔබ දෙමාපියන්ට සහාය වන ආකාරය පියවරෙන් පියවර ඉදිරිපත් කරන්න. (ලකුණු - 10)

11. (i.) ළමයින් තුළ චිත්තවේගී නොසන්සුන්තාවයන් (කැළඹීම්) ඇතිවීමට තුඩු දෙන හේතු තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 05)

(ii.) චිත්තවේගී නොසන්සුන්තාවයන් (කැළඹීම්) ඇති දැරුවන් තුළින් දකින්නට ලැබෙන හැසිරීම් ලක්ෂණ පහක් (05) ලියන්න. (ලකුණු - 05)

(iii.) දරුවන්ගේ චිත්තවේගී නොසන්සුන්තාවයන් (කැළඹීම්) අවම කිරීම සඳහා අධ්‍යාපන මනෝ විද්‍යාව පිළිබඳව අවබෝධයක් ඇති ගුරුවරයෙකු ලෙස ඔබ ක්‍රියා කරන ආකාරය ඉහත සඳහන් කළ ලක්ෂණ පහ (05) ඇසුරු කරගෙන පැහැදිලි කරන්න. (ලකුණු - 10)

12. (i.) පෙළඹීම යන්න නිර්වචනයක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු - 03)

(ii.) ප්‍රජානන ප්‍රවේශය මඟින් පැහැදිලි කරන ආකාරයට පුද්ගලයන් තුළ පෙළඹීම ඇතිවන ආකාර විස්තර කරන්න. (ලකුණු - 07)

(iii.) පෙළඹීම පිළිබඳ ප්‍රජානන ප්‍රවේශය ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඔබ දායක කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු - 10)

13. (i.) සංජානනය සහ අවධානය යන සංකල්ප වෙන වෙන ම පැහැදිලි කරන්න. (ලකුණු - 06)

(ii.) නිවැරදි සංජානනයක් සඳහා අවධානය වැදගත් සාධකයක් වේ. මේ පිළිබඳව ඔබේ අදහස් තර්කානුකූලව ඉදිරිපත් කරන්න. (ලකුණු - 06)

(iii.) පාඩමක් මුළුල්ලේ සිසුන්ගේ අවධානය රඳවා ගැනීම සඳහා ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරයෙකු වශයෙන් ඔබ යොදාගන්නා උපායමාර්ග හතරක් (04) සාකච්ඡා කරන්න. (ලකුණු - 08)

- සියළුම හිමිකම් ඇවිරිණි. -